# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2374/30 – 2024 මාර්තු මස 07 වැනි බ්‍රහස්පතින්දා – 2024.03.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එගොඩපොත පත්තුව සුළු කොට්ඨාසයේ, අංක. 103 ඒ, මොරලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මොරලිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක KE/RWN/2021/318 සහ 2022.03.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’** – රුවන්වැල්ල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0776

උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ සී/ස මල්වත්ත වැලි වැව්ලි සමාගම හිමිකම් කියන රුවන්වැල්ල වත්ත; නැගෙනහිරට: සී/ස මල්වත්ත වැලි වැව්ලි සමාගම හිමිකම් කියන රුවන්වැල්ල වත්ත සහ කැළණි ගඟ; දකුණට: කැළණි ගඟ සහ ඇළ; බටහිරට: ඇළ සහ ප්‍රාදේශීය සභා මාර්ගය.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/04.
2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 03 – 0043